**කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ**

**කුරුඳු සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

**01 සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : කුරුඳු සංවර්ධන

යොමු අංකය : DCD/ADM/02 දිනය :2024.08.15

1.2 අමාත්‍යාංශය : වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්

යොමු අංකය :MPI/Admin/18/Cinnamon/01 දිනය : 2024.08.29

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:

යොමු අංකය:DMS/1300 දිනය:2024.03.13

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:

යොමු අංකය: EST-2/04/REC/14530 දිනය: 2024.07.17

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/07-01-18/01/2024 දිනය : 2025.10.10

**02.පත් කිරීම් බලධරයා:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**03.සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය: ආශ්‍රිත නිලධාරී

3.2 ශ්‍රේණි : III, II හා I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය: ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හිදී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය/ සම්පාදනය/ වාර්තා සම්පාදනය/ සමීක්ෂණය වැනි කාර්යයන් නිශ්චිත කාර්යභාරයක් වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ ද කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.තනතුරෙහි/තනතුරුවල ස්වභාවය:**

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

**05.වැටුප්**

5.1. වැටුප් කේත අංකය: MN4- 2025

5.2. මාසික වැටුප් පරිමාණය: රු.53,060-10 × 800-11 × 1,190-10 × 1,320-5 × 1,350–94,100/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප්තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | 53,060/- |
| II | පියවර 12 | 62,250/- |
| I | පියවර 23 | 75,470/- |

සටහන - වැටුප ගෙවීම සහ සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි සඳහන් විධිවිධානයන්ට අනුකූල විය යුතුයි.

**06.සේවා ගණයට අයත් තනතුර/තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | එම තනතුරවලට පැවරෙන කාර්යයන් |
|---|---|---|---|
| කුරුඳු සංවර්ධන නිලධාරී | III/II/I | 24 | • කුරුඳු සම්බන්ධ පර්යේෂණ සැලසුම් කිරීම, දත්ත එක් රැස් කිරීම, විශ්ලේෂණය, පර්යේෂණ පත්‍රිකා සැකසීම හා ඉදිරිපත් කිරීමට සහාය වීම.<br>• විද්‍යාගාර හා ක්ෂේත්‍ර මට්ටමේ පරීක්ෂණ සේවාවන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම.<br>• පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම.<br>• කුරුඳු ක්ෂේත්‍රයට අදාළ දත්ත පද්ධති පවත්වා ගෙන යාම .<br>• සහතිකකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා ක්ෂේත්‍ර විගණන සඳහා සහාය වීම.<br>• කුරුඳු කර්මාන්තයට සම්බන්ධ පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම සඳහා සහාය වීම.<br>• ව්‍යාපාර උපදේශන කටයුතු සඳහා සහාය වීම.<br>• අවස්ථාවෝචිත පරිදි මාසික, ත්‍රෛමාසික, අර්ධවාර්ෂික, වාර්ෂික සහ වෙනත් වාර්තා අධීක්ෂණ නිලධාරි වෙත ඉදිරිපත් කිරීම.<br>• දෙපාර්තමේන්තුවේ සංවර්ධන සහාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම.<br>• අධීක්ෂණ නිලධාරියා විසින් අවස්ථාවෝචිත පරිදි පවරනු ලබන වෙනත් රාජකාරි ඉටුකිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: කුරුඳු සංවර්ධන නිලධාරි - 24

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ.

**07.**බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම:

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම්:

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

කෘෂිකර්මය, ජෛවීය / ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, හරිත තාක්ෂණය, අපනයන කෘෂිකර්මය හෝ වැවිලි කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයක් යටතේ,

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන (සිව් අවුරුදු) ගෞරව උපාධියක්
  හෝ
- ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ (සිව් අවුරුදු) ගෞරව උපාධියක්
  හෝ
- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් (සිව් අවුරුදු) ගෞරව උපාධියක්

සටහන - තනතුරේ ස්ථිර කිරීමට පෙර ඒ ඒ උපාධියේ සත්‍යතාවය පිළිබඳව අදාළ විශ්වවිද්‍යාලයෙන් සත්‍යාපනය කරගත යුතු වේ.

7.2.2.2 වෘත්තීය සුදුසුකම්: අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද: අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත්:

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව: අවුරුදු 21ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව: අවුරුදු 35ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනුලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවේ අනුපිළිවෙළ

අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය (ඇමුණුම 01)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතාව | 100 | 40 |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 100 | 40 |

7.2.4.1.1 විභාගය පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් හෝ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය: අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: ලකුණු ලබා දෙනු නොලැබේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:

I. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්හි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර බැලීම.
II. ක්ෂේත්‍ර රාජකාරි සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීම.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සටහන - බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අවශ්‍ය යැයි පත්වීම් බලධරයා විසින් අපේක්ෂා කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කළ යුතුය.

7.3 සීමිත බඳවා ගැනීම: අදාළ නොවේ.

7.4.කුසලතා පදනම මත බඳවා ගැනීම: අදාළ නොවේ.

nd

**08 කාර්යක්ෂමතා කඩඉම්**

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය : ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (ඇමුණුම 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (ඇමුණුම 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. විෂය ක්ෂේත්‍රයට අදාළ නිබන්ධනයකි (ඇමුණුම 04) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : අවම වශයෙන් වර්ෂයකට වරක්

8.3 පවත්වන බලධරයා : කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද

I වන කාර්යක්ෂමතා කඩඉම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් විභාග පවත්වනු ලැබේ.

II වන කාර්යක්ෂමතා කඩඉම: කුරුඳු සංවර්ධන අධ්‍යක්ෂ දෙපාර්තමේන්තුවේ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් විභාග පවත්වනු ලැබේ.

III. වන කාර්යක්ෂමතා කඩඉම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ හා ඇගයීම් මණ්ඩලයක් මඟින් පවත්වනු ලැබේ.

**09. භාෂා ප්‍රවීණතාවය**

**9.1**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03ක් ඉකුත් වීමට පෙර ලබා ගත යුතු ය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. පත්වීම ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
III. අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබීම.
V. අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය: සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම, නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබීම.
IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම, නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂ්‍යය :-

සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධරයන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයක් ප්‍රමාද කළ යුතු ය.

11. තනතුරුවලට පත් කිරීම :- අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

nd

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථනිරූපණ : අදාළ නොවේ

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය: අදාළ නොවේ

17. අන්තර්කාලීන විධිවිධාන: අදාළ නොවේ

සකස් කළේ : ..................................
ඕ.කේ .ඩී මානෙල්
සංවර්ධන නිලධාරි
2025.10. 17

පරීක්ෂා කළේ : ..................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි)
චතුරංග ගුණසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
2025.10. 17

චතුරංග ගුණසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන)
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු
ගුණරත්න වීරකෝන් මාවත
බොරකන්ද, කරන්දෙණිය

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
එල්. එම්. ජේ. කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

දිනය: 2025.10. 17

යොමු අංකය: M.P.C.I./Admin/18/Cinnamon 01/Vol II

**18.** **අමාත්‍යාංශ නිර්දේශය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.10.10 දින අනුමත කරන ලද කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..........................................
බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
ලේකම්
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

දිනය: 2025.10.17

බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
ලේකම්
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
8 වන මහල, සෙත්සිරිපාය අදියර II
බත්තරමුල්ල

---

යොමු අංකය: PSC/EST/07-01-18/01/2024

**19.** **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :**

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.10.10 දින අනුමත කරන ලදි.

..........................................
ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2026. 2.23

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඇමුණුම 01

**විභාගය / වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01.විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ විභාගය

02.විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40 |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතාව | අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය ,අර්ථකථනය, සම්බන්ධතා දැකීම,පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතු ඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම හා උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| පොදු පරීක්ෂණය (තාක්ෂණය හා විෂයානුබද්ධ අධ්‍යයනය) | 1.ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය<br>i. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මයේ දායකත්වය<br>ii. රැකියා නියුක්තිය<br>iii.ගොවි ජනතාවට සේවාවන් සපයන විවිධ ආයතන<br>2. වැවිලි භෝග වගාව<br>i. වැවිලි භෝග වගාව පිළිබඳ පොදු දැනුම<br>ii. කුරුඳු වගාවේ ඉතිහාසය<br>iii.කුරුඳු භෝගයේ ව්‍යාප්තිය, සමස්ත නිෂ්පාදනය, වගා වපසරිය<br>3.ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප පිළිබඳ දැනුම<br>4. පස හා ශාක පෝෂණය<br>i. පසේ භෞතික හා රසායනික ලක්ෂණ<br>ii. ශාක පෝෂණ පිළිබඳ දැනුම<br>iii. ශාක රෝග කාරක හා පළිබෝධ පිළිබඳ දැනුම<br>iv. කෘෂි රසායනික පිළිබඳ අවබෝධය<br>v. ශ්‍රී ලංකාවේ පස් කාණ්ඩ පිළිබඳ සරල අවබෝධය<br>5. කෘෂිකර්ම ව්‍යාප්තිය<br>i. කෘෂිකර්ම ව්‍යාප්තිය හා සන්නිවේදන ක්‍රම<br>6. නවීන කෘෂි තාක්ෂණය, කෘෂිකාර්මික නවීන තාක්ෂණික ක්‍රම<br>i. ජාන තාක්ෂණය<br>ii. නැනෝ තාක්ෂණය<br>iii.හරිතාගාර තාක්ෂණය<br>iv.ගෝලීය ස්ථාන නිර්ණයන පද්ධති තාක්ෂණය (GPS - Global Positioning System)<br>v. ඩ්‍රෝන තාක්ෂණය<br>vi.දේශගුණික විපර්යාස අවම කිරීම හා අනුවර්තනය |

| | |
|---|---|
| | vii. සුහුරු කෘෂිකර්මය (Smart Agriculture)<br>7. ශාක කායික විද්‍යාව<br>i. ශාක ප්‍රභාසංස්ලේෂණය<br>ii. උත්ස්වේදනය<br>iii. ශ්වසනය<br>iv. ශාක ජල සබඳතාව |

.............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
එල්. එම්. ජේ. කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
2025.10.17

එල්. එම්. ජේ. කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

nd

ඇමුණුම 02

**විභාගය / වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01. විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40 |
| ගිණුම් ක්‍රම, මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 02 | 100 | 40 |
| විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුම | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන අනුමත ආයතනයක් මඟින් පවත්වනු ලැබේ .

04. පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වර්ෂයකට වරක්

සටහන : නිලධරයන්ට තම කැමත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාර වලට විභාගයට පෙනී සිටිය හැකි වේ. එතෙකුදු වුව ද සාමර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | • රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව ද, රාජකාරි ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්තව සටහන් මගින් තම අදහස්/ නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාවද පරීක්ෂා කෙරේ.<br>• ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති |
| ගිණුම් ක්‍රම, මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | • රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.<br>• මුදල් රෙගුලාසි සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, IV, V හා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, ප්‍රසම්පාදන අත්පොත හා පරිපූරක. |

nd

| | |
|---|---|
| විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුම | • ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන දත්ත/ සංඛ්‍යාලේඛන<br>• ආර්ථික සංවර්ධනයට කුරුඳු කර්මාන්තයේ දායකත්වය<br>• කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය, මෙහෙවර/ විවිධ අංශවල කාර්යභාරය<br>• ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප සහ ඒවා වර්ගීකරණ හේතු සාධක<br>• ව්‍යාප්තියේ දී භාවිතා කළ හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක<br>• කුරුඳු වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය<br>• කාලීන වැදගත් කෘෂිකාර්මික තොරතුරු<br>• ක්ෂේත්‍ර පරීක්ෂණ පැවත්වීමේ දී සළකා බැලිය යුතු කරුණු<br>• පැළැටි පෝෂණ පවත්වා ගැනීමේ දි ඒකාබද්ධ ක්‍රමෝපායන්<br>• කුරුඳු වගාවේ තවාන් පාලනය<br>• කුරුඳු වගාවේ වියදම් ඇස්තමේන්තු සැකසීම<br>• කුරුඳු වගාවේ සහතිකකරණ ක්‍රියාවලිය (GAP, GMP, GI) |

..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
එල්. එම්. ජේ. කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
2025.10. 17

nd

ඇමුණුම 03

**විභාගය / වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගයේ/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුම | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන අනුමත ආයතනයක් මඟින් පවත්වනු ලැබේ .

04. පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුම | • කුරුඳු කර්මාන්තයට අදාළ පනත්, වෙළඳ ගිවිසුම්<br>• ඒකාබද්ධ පාංශු පෝෂණ කළමනාකරණය<br>• කාලීන කෘෂිකාර්මික තොරතුරු<br>• කුරුඳු නිෂ්පාදනවල අගය වැඩිකිරීම, ඇසුරුම්කරණය, වෙළඳපොළට සැකසීම<br>• ව්‍යාප්තියට අදාළ විශේෂ වැඩසටහන්<br>• දත්ත හා තොරතුරු රැස්කිරීමේ ක්‍රම සහ ඒවා ආශ්‍රයෙන් කර්මාන්තයට අදාළ තීරණ ගැනීම<br>• නව උසස් තාක්ෂණය<br>• කෘෂි නිෂ්පාදන වැඩි කිරීම සඳහා ගොවිපොළ යාන්ත්‍රිකරණයේ කාර්යභාරය<br>• කුරුඳු වගා ක්‍රියාවලියේ දී පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම<br>• කුරුඳු වගාවක් තක්සේරු කිරීම |

..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)
එල්. එම්. ජේ. කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
2025.10. 17

ඇමුණුම 04

**විභාගය / වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර**

01. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගයේ/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තරය :

| **විෂය ක්ෂේත්‍රය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් ලකුණු** |
|---|---|---|---|
| විෂය ක්ෂේත්‍රයට අදාළ නිබන්ධනය | සති 03 | 100 | 50 |

03. පවත්වනු ලබන බලධාරියා : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ හා ඇගයීම් මණ්ඩලයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වර්ෂයකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| **ප්‍රශ්න පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| විෂය ක්ෂේත්‍රයට අදාළ නිබන්ධනය | කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන මාතෘකාවක් උදා:- තත්කාලීන ප්‍රශ්නයක් හෝ ගැටළුවක් හෝ විෂය නිර්දේශය මත විද්‍යාත්මක ඇගයීමක් විභාග අපේක්ෂකයා විසින් කර, වචන භාරදාහකට නොඅඩු නිබන්ධනයක් ඉදිරිපත් කිරීම. |

සටහන : i. විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර ඇත්නම් හෝ නිලධාරියාගේ සහභාගීත්වයෙන් සිදු කරන ලද පර්යේෂණයකට අදාළ පර්යේෂණ පත්‍රිකාවක් දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ජර්නලයක/ විද්‍යාත්මක සඟරාවක පළකර ඇත්නම් සුදුසු නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත මෙම කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කළ හැකිය.

ii. ඉහත සටහන i හි පශ්චාත් උපාධි විෂය ක්ෂේත්‍රයට අදාළ වීම පිළිබඳ අවසාන තීරණය කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

.....................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
එල්. එම්. ජේ. කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
2025.10. 17

# ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

1. නිලධාරියා පිළිබඳ තොරතුරු

1.1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ....................................................................................

1.2. හැඳුනුම්පත් අංකය : ....................................................................................

1.3. සේවා ස්ථානය හා එහි ලිපිනය : ....................................................................................

1.4. අයත්වන සේවය හා තනතුර : ....................................................................................

1.5. අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය: ....................................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1. පත්වීම් දිනය : ....................................................................................

2.2. පත්වීම ස්ථිර කළ දිනය : ....................................................................................

2.3. සමත් වූ කාර්යක්ෂමතා කඩඉම් හා සමත් දිනය:

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් වියයුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4. සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය:

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් වියයුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාළ තොරතුරු

3.1. උසස් වීම අපේක්ෂිත ශ්‍රේණිය : II/I/විශේෂ

3.2. උසස් වීම අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය/ සුවිශේෂී

3.3.

3.3.1. අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත

3.3.2. සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ....................................................

3.3.3. අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේ ද? ඔව්/නැත

3.3.4. නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේ ද? ඔව්/නැත

nd

3.3.5. උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත

3.3.6. විනය දඬුවමක් ලබා තිබේ ද? ඔව්/නැත

3.3.7. සුවිශේෂී කාර්යසාධනය යටතේ ලිඛිත විභාගය සමත් වූ දිනය : ..........................

3.3.8. විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය : ..........................

3.3.9. සුවිශේෂී කාර්යසාධනය යටතේ විභාගයට පෙනී සිටි වාර ගණන : ..........................

3.3.10. නියමිත දිනට සුවිශේෂී කාර්යසාධනය සඳහා වූ අභියෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට නොහැකි වූයේ නම් ඊට හේතු : ..............................................................................

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ................................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය / සුවිශේෂී කාර්යසාධනය යටතේ II / I / විශේෂ ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ....................................... ................................................

නිලධරයාගේ අත්සන

5. දෙපාර්තමේන්තු ප්‍රධානගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් .......................................................................................... මහතා/මෙනෙවිය/මහත්මිය .................................................... සේවා ගණයේ .................................................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය / සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ......................................................

අත්සන : ......................................................

දිනය : ......................................................

නිල මුද්‍රාව : ......................................................

6. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් ඉහතින දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත් ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම : ......................................................

අත්සන : ......................................................

දිනය : ......................................................

නිල මුද්‍රාව : ......................................................

7. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්/පත්වීම් බලධරයා

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ........................................ මහතා/ මහත්මිය/ මෙනවිය ................. සේවා ගණයේ .................. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය / සුවිශේෂී කාර්යසාධනය යටතේ .............................. දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ......................................................

අත්සන : ......................................................

දිනය : ......................................................

නිල මුද්‍රාව : ......................................................

(පරිපාලන බලධරයා)